Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 36-48

DOI: https://doi.org/10.4038/sllr.v39i2.79

මහජන පුස්තකාලවල ප්‍රබන්ධ කෘති එකතුව වර්ගීකරණය පිළිබඳ නිරීක්ෂණාත්මක අධ්‍යයනයක්

An Observational Study on the Classification of Fiction Collections in Public Libraries

Alahakoon, Uditha[1]

Abstract

Almost all public libraries in Sri Lanka use the Dewey Decimal Classification for classifying their collections. The Dewey Decimal Classification is a classification system that is being revised in line with the expansion in various subject areas. This feature is particularly evident in the classification of original and translated fiction works. The primary objective of this study is to conduct an observational study of the methods used in classifying fiction collections in the grade 1 public libraries of the Western Province. The main point revealed is that although librarians have accepted the need to use the latest edition of the Dewey Classification for the classification of fiction collections, the implementation of the changes has been delayed due to various reasons. It was observed that there are many confusions and errors, especially in the classification of translated literature. Since literature is a field that is diversifying rapidly compared to all other subject areas, this updating is essential. If public libraries do not have this up-to-dateness, it will be a violation of reader rights, a violation of Ranganathan's five laws, and a prevention of opportunities for readers to be exposed to the genre, geographical and linguistic diversity of world literature. It was also observed that the use of color codes in classification is not done with a standard. Therefore, it is recommended that public libraries should immediately abandon the old methods and use the latest edition of the Dewey Decimal Classification in classifying fiction works, and if color codes are used, they should do so in a standardized manner. Also, holding workshops to increase the awareness of public library staff on the classification of fiction works and emphasizing the importance of library staff engaging in self-study to develop their knowledge of world literature will lead to an increase in the quality of the classification of fiction works.

Keywords: Fiction collection, public library, Dewey Decimal Classification, DDC, classification systems

---

[1] Senior Assistant Librarian , National Institute of Library and Information Sciences, University of Colombo

Email: uditha@nilis.cmb.ac.lk

Received: 18th May 2025, Accepted revised version: 20th June 2025
This work is licensed under a Creative Commons Attribution-Share Alike 4.0 International License.

Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 36-48

DOI: https://doi.org/10.4038/sllr.v39i2.79

සාරාංශය

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සියල්ලම පාහේ ස්වකීය එකතු වර්ගීකරණය සඳහා භාවිත කරනුයේ ඩිවි දශම වර්ගීකරණයයි. ඩිවි දශම වර්ගීකරණය යනු විවිධ විෂය ක්ෂේත්‍රවල සිදුවන ව්‍යාප්තියට සාපේක්ෂව සංස්කරණය වන වර්ගීකරණ සංග්‍රහයකි. විශේෂයෙන් ස්වතන්ත්‍ර සහ පරිවර්තන ප්‍රබන්ධ කෘති වර්ගීකරණයේ දී මෙම ලක්ෂණය මනාව දිස් වේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ බස්නාහිර පළාතේ පළමුවන ශ්‍රේණියේ මහජන පුස්තකාලවල ප්‍රබන්ධ එකතු වර්ගීකරණයේ දී භාවිත ක්‍රම පිළිබඳ නිරීක්ෂණාත්මක අධ්‍යයනයක යෙදීම වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් අනාවරණය වූ කරුණ වන්නේ ප්‍රබන්ධ එකතු වර්ගීකරණය සඳහා ඩිවි වර්ගීකරණයේ නවතම සංස්කරණය යොදා ගැනීමේ අවශ්‍යතාව පුස්තකාලයාධිපතීන් පිළිගත්ත ද විවිධ හේතු නිසා එම වෙනස්වීම් ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම ප්‍රමාද කිරීමය. විශේෂයෙන් පරිවර්තන සාහිත්‍ය වර්ගීකරණයේ දී ව්‍යාකූලතා සහ දෝෂ රැසක් පවතින බව පෙණිනි. සාහිත්‍ය යනු අන් සියලු විෂය ක්ෂේත්‍රයන්ට සාපේක්ෂව සීග්‍රයෙන් විවිධත්වයට පත්වන ක්ෂේත්‍රයක් බැවින් මෙකී යාවත්කාලීව වීම අත්‍යවශ්‍ය වේ. මෙම යාවත්කාලීන බව මහජන පුස්තකාල සතුව නොපැවතුණහොත් එය පාඨක අයිතීන් උල්ලංඝනය කිරීමක් ද රංගනාදන්ගේ පංචවිධ නියාමයන්ට එරෙහි වීමක් ද විශ්ව සාහිත්‍යයේ ශානරීය, භූගෝලීය සහ භාෂාමය විවිධත්වය පාඨකයාට නිරාවරණය කර ගැනීමට තිබෙන අවස්ථා වලක්වාලීමක් වනු ඇත. එමෙන් ම වර්ගීකරණයේ දී වර්ණ කේත භාවිතය ද ප්‍රමිතියක් සහිතව සිදු නොවන බව ද නිරීක්ෂණය විය. එහෙයින් මහජන පුස්තකාල ප්‍රබන්ධ කෘති වර්ගීකරණයේ දී පැරණි ක්‍රම අතහැර ඩිවි දශම වර්ගීකරණයේ නවතම සංස්කරණය භාවිත කිරීමත්, වර්ණ කේත භාවිත කරන්නේ නම්, එය යම් ප්‍රමිතිගත ක්‍රමයකට සිදු කිරීමටත් නොපමාව පියවර ගත යුතු බව මෙයින් නිර්දේශ කෙරේ. එමෙන්ම ප්‍රබන්ධ කෘති වර්ගීකරණය පිළිබඳ මහජන පුස්තකාල කාර්යමණ්ඩලවල දැනුවත්භාවය වර්ධනය කිරීමට වැඩමුළු පැවැත්වීමත් විශ්ව සාහිත්‍ය පිළිබඳ ස්වකීය දැනුම වර්ධනය කිරීම සඳහා පුස්තකාල කාර්යමණ්ඩල ස්වයං අධ්‍යයනයක යෙදීමේ වැදගත්කම අවධාරණය කිරීමත් ප්‍රබන්ධ කෘති වර්ගීකරණයේ ගුණාත්මකබව ඉහළ නැංවීමට හේතු වනු ඇත.

ප්‍රමුඛ පද : ප්‍රබන්ධ එකතුව, මහජන පුස්තකාල, ඩිවි දශම වර්ගීකරණය, වර්ගීකරණ ක්‍රම

හැඳින්වීම

පුස්තකාලයක එකතුව ප්‍රබන්ධ සහ ප්‍රබන්ධ නොවන වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. මහජන පුස්තකාලවල දී මෙම කොටස් දෙක අතරින් ප්‍රබන්ධ එකතුවට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. ප්‍රබන්ධ එකතුව නැවතත් ස්වතන්ත්‍ර සහ පරිවර්තන වශයෙන් මූලික බෙදීමකට ලක් කළ හැකිය. මහජන පුස්තකාලවල පොත් බැහැර ගෙන යාමේ සංඛ්‍යා දත්තවලට අනුව ප්‍රබන්ධ නොවන එකතුවට

Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 36-48
DOI: https://doi.org/10.4038/sllr.v39i2.79
වඩා ප්‍රබන්ධ එකතුවට සුවිශේෂී ස්ථානයක් හිමිවන බව පැහැදිලිව විද්‍යමාන වේ. මෙම ස්වතන්ත්‍ර සහ පරිවර්තන ප්‍රබන්ධ ඊළඟ පියවරේදී පද්‍ය, නාට්‍ය, නවකතා සහ කෙටිකතා වශයෙන් මූලික ශානර හෙවත් ප්‍රභේද හතරකට වෙන් කළ හැකිය. පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රබන්ධ කෘති ප්‍රකාශයට පත්වීම සීඝ්‍ර ප්‍රමාණාත්මක වර්ධනයක් අත්පත්කර ඇති බව ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ සංඛ්‍යා දත්තවලින් සනාථ වේ. මේ අනුව 1950 දශකයේ පළ වූ ස්වතන්ත්‍ර ප්‍රබන්ධ සංඛ්‍යාව 505කි. එහෙත් 2018 වර්ෂය පමණක් ගත් විට එම සංඛ්‍යාව 930 කි. මේ අනුව වසරක සාමාන්‍ය අගය 850ක් ලෙස ගත්ත ද 21 වන සියවසේ දෙවන දශකයේ පළව ඇති ස්වතන්ත්‍ර ප්‍රබන්ධ සංඛ්‍යාව 8500ක් ලෙසින් දළ වශයෙන් උපකල්පනය කළ හැකිය. පරිවර්තන සාහිත්‍ය පිළිබඳ සලකා බැලීමේදී මෙම ප්‍රමාණාත්මක වර්ධනය ආසන්න වශයෙන් ඊට සමාන අගයක් ගෙන ඇති බව පෙනේ. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියට අනුව 1950 දශකයේදී පළ වූ පරිවර්තන ප්‍රබන්ධ කෘති සංඛ්‍යාව 98 කි. 1960 දශකයේදී එම සංඛ්‍යාව 130 ක් දක්වා වර්ධනය වී ඇත. එහෙත් 2018 වසර තුළ පමණක් පරිවර්තන ප්‍රබන්ධ කෘති 175 ක් පළ වී තිබේ. එහෙයින් 2011-2020 දක්වා දශකය තුළ වසරකට පළ වූ පරිවර්තන ප්‍රබන්ධ සංඛ්‍යාව 150 ක් ලෙස උපකල්පනය කළහොත් එම දශකයේ එවන් කෘති 1500ක් පමණ ප්‍රකාශයට පත්ව ඇතැයි යන නිගමනයට එළඹිය හැකිය.මෙයින් පෙනී යන්නේ පසුගිය වසර 60 තුළ පරිවර්තිත ප්‍රබන්ධ කෘති පළ වීමේ සීඝ්‍රතාව දසගුණයකින් පමණ ඉහළ ගොස් ඇති බවය. මෙයට අමතරව මෙම කාලය පුරා ස්වතන්ත්‍ර මෙන්ම පරිවර්තන සාහිත්‍ය තුළ භාෂාමය, තේමාත්මක, ආඛ්‍යාන රටාමය සහ ශානරීය විවිධත්වයද විශාල වශයෙන් ඉහළ ගොස් ඇති බව පෙනේ. මෙයට අමතරව පාඨකයාගේ පාර්ශවයෙන් ගත්විට, පසුගිය දශක කිහිපයේදී පරිවර්තන සාහිත්‍ය වෙත සාපේක්ෂව වැඩි ආකර්ෂණයක් ලැබී ඇති බවද දක්නට ලැබේ. එමෙන්ම ඉහත කී විවිධත්වය සහ පාඨක රුචිකත්වය අතර ශක්තිමත් අන්‍යෝන්‍ය සබඳතාවක් ගොඩනැඟෙමින් පවතින බවද දෘශ්‍යමාන වේ.

අධ්‍යයන ගැටලුව

මහජන පුස්තකාල සමස්තයක් ලෙස ඒවායේ එකතු වර්ග කිරීම සඳහා ඩිවි දශම වර්ගීකරණය යොදා ගනී. එහෙත් සාහිත්‍ය කෘති, විශේෂයෙන් ප්‍රබන්ධ කෘති වර්ග කිරීමේ දී වෙනත් ක්‍රම භාවිත කරන බව පෙනී යයි. මෙම වෙනත් ක්‍රම අතරින් ඩිවි දශම වර්ගීකරණයේ 17 වන සංස්කරණය මඟින් 1965 දී හඳුන්වා දෙන ලද ක්‍රමය ප්‍රමුඛ වේ. ඒ අනුව ස්වතන්ත්‍ර නවකතා සඳහා ප්‍ර 1 ද කෙටිකතා සඳහා ප්‍ර 2 ද පරිවර්තන කෘති සඳහා ප්‍ර 3 ද වශයෙන් සංකේත ක්‍රමයක් ව්‍යවහාර කරයි. මෙම සංකේතය සමඟ කතුවරයාගේ වාසගමෙන් මුල් අකුර හෝ අකුරු තුන ඇමතුම් අංකය ලෙස සටහන් කෙරේ. මෙම ක්‍රමය ප්‍රබන්ධ කෘති සීමිත ප්‍රමාණයක් පළවූ යුගයකට ගැලපුනද ප්‍රබන්ධ කෘති ප්‍රකාශයට පත් වීමේ සීඝ්‍රතාව ඉහළ මට්ටමක පවත්නා වර්තමානයට කිසිසේත්ම නොගැළපෙන බව පැහැදිලිය. ස්වතන්ත්‍ර සාහිත්‍යයේ පවා සෑම ප්‍රධාන ශානරයකම (පද්‍ය, නාට්‍ය, නවකතා, කෙටිකතා) උපශානරීය විවිධත්වය වර්ධනය වෙමින් පවතී. පාඨකයෝ ප්‍රබන්ධ කෘති සෙවීමේ දී මෙම උපශානරීය ස්වභාවය වෙත අවධානය යොමු කරති. එමෙන්ම පසුගිය දශක දෙක හෝ තුන තුළ පරිවර්තන සාහිත්‍ය විශාල වර්ධනයක් අත්පත්

DOI: https://doi.org/10.4038/sllr.v39i2.79
කරගෙන තිබේ. තවද, මව් භාෂාව ඉංග්‍රීසි භාෂාව නොවන රටවල ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රබන්ධකරණයේ යෙදෙන ලේඛකයන්ගේ සංඛ්‍යාවද ක්‍රමිකව වර්ධනය වෙමින් පවතී. මේ අනුව පාඨක රුචිකත්වය ද ප්‍රබල වෙනසකට බඳුන් වීම වැළැක්විය නොහැකිය. ප්‍රබන්ධ ක්ෂේත්‍රයේ සිදුවන මෙම විවිධත්වය පාඨකයා වෙත සමීප කිරීම පුස්තකාලවල වගකීමකි. එහෙත් අදින් වසර හැටකට පමණ පෙර නිර්දේශිත ක්‍රමයක් භාවිත කිරීමෙන් මූලික වශයෙන් පාඨක අයිතිය උල්ලංඝනය කිරීමක් ද සිදු වේ. එහෙයින් ප්‍රබන්ධ කෘති ප්‍රකාශනයේ වර්තමාන තත්ත්වයට ගැලපෙන අයුරින් මහජන පුස්තකාලවල ප්‍රබන්ධ කෘති වර්ගීකරණ කාර්ය සිදුකිරීම අත්‍යවශ්‍ය වේ.

අධ්‍යයනයේ අරමුණු

- මහජන පුස්තකාලවල ප්‍රබන්ධ වර්ගීකරණය සඳහා වර්තමානයේ භාවිත කරනු ලබන ක්‍රම හඳුනා ගැනීම.
- ප්‍රබන්ධ සාහිත්‍ය ක්ෂේත්‍රයේ මෑතකාලීනව සිදුව ඇති ප්‍රවණතා විග්‍රහ කිරීම.
- එම නව ප්‍රවණතා සහ භාවිත කරන ක්‍රම අතර ගැලපීම තුලනාත්මකව විමසීම.
- ප්‍රබන්ධ වර්ගීකරණය සඳහා ඩිවි දශම වර්ගීකරණය භාවිත කිරීමේ යෝග්‍යතාව විවරණය කිරීම.

අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා සමීක්ෂණ ක්‍රමවේදය භාවිත කරන ලද අතර නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත එක්රැස් කෙරිණි. බස්නාහිර පළාතේ 1 ශ්‍රේණියේ මහජන පුස්තකාල 13ක් සහේතුක නියැදිය ලෙස භාවිත කරන ලදී. මේ අනුව ගම්පහ, කඩුවෙල, දෙහිවල, ගල්කිස්ස, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, පානදුර. හොරණ, මොරටුව, මහරගම, පිළියන්දල, සීදූව, කටාන යන මහ නගර සභා සහ නගර සභාවලට අයත් පුස්තකාල ද හොරණ ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාලය ද නුගේගොඩ මහජන පුස්තකාලය ද මෙම නියැදියට අයත් වේ.

සාහිත්‍ය විමර්ශනය

කේම්බ්‍රිජ් ශබ්දකෝෂයේ ප්‍රබන්ධය යන වදන නිර්වචනය කරනුයේ පරිකල්පනීය චරිත සහ සිදුවීම් පිළිබඳ රචනා කරනු ලබන සහ සැබෑ පුද්ගලයන් සහ කරුණු මත පදනම් නොවූ කෘති වර්ගයක් ලෙසය. මෙම ප්‍රබන්ධ නැවතත් නවකතා, කෙටිකතා, පද්‍ය, නාට්‍ය, තිරරචනා වශයෙන් ප්‍රධාන ප්‍රභේද හතරකට බෙදා දැක්වේ. එහෙත් වර්තමානය වන විට මෙම ප්‍රභේද විවිධ ශානරවලට අනුව රචනා වන බව පැහැදිලිව පෙනී යයි. නවකතා උදාහරණයක් ලෙස ගත් විට ඒවා ඓතිහාසික, විද්‍යා, අද්භූත, ත්‍රාසජනක යනාදී වශයෙන් ශානර ගණනාවකින් යුක්ත වේ. (Eaglestone, 2013) මේ අනුව ප්‍රබන්ධ සාහිත්‍ය වඩාත් සංකීර්ණත්වයට පත් වෙමින් පවතී. මේ නිසාම ප්‍රබන්ධ කියවීමට ඇති පාඨක නැඹුරුව ද විවිධත්වයෙන් යුක්ත වෙමින් තිබේ. කියවීමේ පුරුද්ද, කියවීමේ රුචිය යනාදිය සමග වඩාත් සමීපයෙන් බැඳී

Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 36-48

DOI: https://doi.org/10.4038/sllr.v39i2.79
පවතින්නේ ප්‍රබන්ධ සාහිත්‍යයය. මහජන පුස්තකාල ප්‍රජාවගේ කියවීමේ ප්‍රවර්ධනය සඳහා ප්‍රශස්ත මට්ටමේ ප්‍රබන්ධ එකතු පවත්වා ගෙන යනුයේ එහෙයිනි. ප්‍රජාවගේ රසවින්දනාත්මක අවශ්‍යතා ඉටු කිරීමේ ප්‍රමුඛ වගකීමක් මහජන පුස්තකාලවලට පැවරේ. ඉෆ්ලා-යුනෙස්කෝ මහජන පුස්තකාල මාර්ගෝපදේශ සංග්‍රහය (2001) සඳහන් කරන ආකාරයට මහජන පුස්තකාල ප්‍රශස්ත ප්‍රබන්ධ එකතුවක් ගොඩ නංවා ගත යුතුය. එමෙන්ම එලෙස ගොඩනංවන එකතුව දේශීය මෙන්ම විශ්ව සාහිත්‍යයේ විවිධත්වය පිළිඹිබු වන ආකාරයට පාඨකයා වෙත සමීප කිරීමට අවශ්‍ය පියවර ගැනීම ද වැදගත් වේ. ප්‍රබන්ධ එකතුව විධිමත්ව,තාර්කිකව සහ යාවත්කාලීන අයුරින් වර්ගීකරණයට ලක් කිරීමේ අවශ්‍යතාව පැන නගින්නේ මෙහිදීය. ලෝකයේ මහජන පුස්තකාලවලින් අති බහුතරයක් එකතු වර්ගීකරණය සඳහා ඩිවි දශම වර්ගීකරණය යොදාගනී. ඩිවි වර්ගීකරණයේ පළමු සංස්කරණයේ සිටම සම්පූර්ණ වර්ග පංතියක් සාහිත්‍ය සඳහා වෙන්කර තිබේ. එමෙන්ම එයින් සෑහීමකට පත් නොවී සාහිත්‍යයේ ශානරීය සහ ප්‍රභේදමය විවිධත්වය ප්‍රක්ෂේපනය කිරීමට 3A, 3B සහ 3C වශයෙන් වගු තුනක් ද සම්පාදනය කර ඇත (DDC 23, 2012). මෙයට හේතුව පාඨකයා වෙත ප්‍රබන්ධ සාහිත්‍යයේ ශානරීය විවිධත්වය සමීප කිරීමටත් පාඨකයා ඒ වෙත ආකර්ශනය කර ගැනීමටත් එය අත්‍යවශ්‍ය කොන්දේසියක් වන බැවිනි. තව ද එමගින් කියවීම් ප්‍රවර්ධනයට උත්තේජනයක් සපයන බැවිනි. ඩිවි දශම වර්ගීකරණය වැනි පරිගණිත වර්ගීකරණ ක්‍රමවලට අමතරව ලෝකයේ මහජන පුස්තකාල ශානර අනුව වර්ග කිරීමත් බහු මුඛාශ්‍රිත ප්‍රබන්ධ විශ්ලේෂණ ක්‍රමත් විෂය ශීර්ෂ යෙදීමත් කතුවරයාගේ නමෙහි ආකාරාදී අනුවත් ප්‍රබන්ධ වර්ගීකරණය සිදුකෙරේ. (Brown, 2021) ප්‍රබන්ධ වර්ගීකරණයේ දී පාඨක චර්යාව සහ රුචිකත්වයද අවධානයට යොමු කිරීම වැදගත්ය. පෙජ්ටර්සන් සහ ඔස්ටින් (1983) මෙහි පවත්නා සංකීර්ණත්වය අවධාරණය කරති.

> “එක් පාඨකයෙක් නවකතාවක් තෝරනුයේ එය රහස් පරීක්ෂක කතාවක් වීම නිසාය. තවෙකෙකු එය ඇමරිකානු දේශපාලනයේ පිළිබඳ විචාරාත්මක විස්තරයක් වන බැවින් තම තෝරා ගැනීම කරනු ඇත. තෙවැන්නා එම ප්‍රබන්ධය කියවීමට කුතුහලය දක්වන්නක් නිසා තෝරා ගනු ඇත. තවත් අයෙකු එය සැන් ෆ්‍රැන්සිස්කෝ නගරය පසුබිම් කර රචිත නිසා ඊට ආකර්ශනය වීමට ඉඩ ඇත. ” (4 පි.)

මහජන පුස්තකාලවල ප්‍රබන්ධ වර්ගීකරණයේ දී සාහිත්‍ය තුළ වර්ධනය වන සංකීර්ණතා මෙන්ම පාඨක රුචිකත්වයේ සිදුවන විපරිණාමයන්ද සැලකිල්ලට ගත යුතු බව මෙයින් පැහැදිලි වේ.

Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 36-48
DOI: https://doi.org/10.4038/sllr.v39i2.79

අනාවරණ

නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මඟින් අනාවරණය වූ කරුණු ගණනාවක් තිබේ. පුස්තකාල සියල්ලම සමස්ත එකතුව වර්ග කිරීමට ඩිවි දශම වර්ගීකරණය යොදාගෙන තිබීම, එක් පුස්තකාලයක් සමස්ත ප්‍රබන්ධ එකතුව පැරණි ක්‍රමයට (ප්‍ර 1, ප්‍ර 2, සහ ප්‍ර 3) වර්ගකර තිබීම, පුස්තකාල 05ක් පැරණි ක්‍රමය සහ ඩිවි වර්ගීකරණය මිශ්‍රව භාවිත කිරීම, එම පුස්තකාල ඩිවි වර්ග අංක භාවිත කළ ද ප්‍රබන්ධ කෘති රාක්කගත කිරීමේදී පැරණි ක්‍රමය අනුගමනය කිරීම, එක් පුස්තකාලයක් පැරණි ක්‍රමයේ සිට ඩිවි ක්‍රමයට මාරු වීමේ සංක්‍රාන්ති අවධියක පසු වීම, වර්ණ කේත භාවිතයේ දී පුස්තකාල අතර සමරූපිතාවක් නොමැතිවීම, ඩිවි වර්ගීකරණය භාවිතයේ වැදගත්කම පුස්තකාලයාධිපතීන් විසින් පිළිගැනීම සහ කාර්යමණ්ඩල ගැටලු හේතුවෙන් ක්‍රමය මාරු කිරීම ප්‍රමාද වීම, ඉංග්‍රීසි නොවන ප්‍රබන්ධ සඳහා වර්ග අංක යෙදීමේදී ව්‍යාකූලතා පැවතීම, යනාදිය එකී අනාවරණ ලෙස දැක්විය හැකිය. අවම වශයෙන් ස්වතන්ත්‍ර කෘති වර්ගීකරණයේ දී ඩිවි දශම වර්ගීකරණ සංග්‍රහයේ 3 B සහායක වගුවෙන් ප්‍රයෝජනයක් නොගැනීම ද දක්නට ලැබේ.

සාකච්ඡාව

ඉන්දියානු පුස්තකාල විද්‍යාවේ පියා ලෙස සලකන ආචාර්ය එස්. ආර්. රංගනාදන් 1931 දී පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය වෙත නියාමයන් පහක් ඉදිරිපත් කළේය. පුස්තකාල ක්ෂේත්‍රය පසුගිය දශක ගණනාව පුරා කවර වෙනස්කම්වලට ලක් වුවද, මෙම පංචවිධ නියාම අදටත් වලංගු වේ. පොත් පාඨකයන් සඳහාය, සෑම පාඨකයෙකුට ම පොතක්, සෑම පොතකටම පාඨකයෙක්, පාඨකයාගේ කාලය ඉතිරි කරන්න සහ පුස්තකාලය යනු වැඩෙන ආයතනයකි යන්න එකී නියාමයන්ය. පුස්තකාල එකතුව විධිමත්ව සහ නිවැරදිව වර්ගීකරණය කර තිබීම මෙම නියාම සාක්ෂාත් කර ගැනීමේ මූලික කොන්දේසිය වේ. වෙනත් ආකාරයකට පවසන්නේ නම්, පුස්තකාල එකතුව නිසි පරිදි වර්ග කර නොතිබීම පාඨකයාගේ මෙන්ම කාර්යමණ්ඩලයේ ද කාර්යක්ෂමතාව වෙත නිශේධනාත්මකව බලපායි. එවිට පාඨකයෙකුට අවම කාලයක් තුළ තමන්ට අවශ්‍ය කෘතිය සොයා ගැනීම දුෂ්කර වේ. පුස්තකාල එකතු නිරන්තරයෙන් වර්ධනය වන විට පාඨකයන්ට මුහුණ දීමට සිදුවන තත්ත්වය එතරම් සතුටුදායක නොවේ.

ප්‍රබන්ධ සාහිත්‍ය සහ ඩිවි දශම වර්ගීකරණය

මෙම සංකල්පීය ඉදිරිපත් කිරීම යථාර්ථයක් බවට පත් කිරීම සඳහා ලොව පුරා මහජන පුස්තකාල ස්වකීය එකතු වර්ග කිරීමට ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වර්ගීකරණ ක්‍රමයක් යොදා ගනී. එය ඩිවි දශම වර්ගීකරණය නම් වේ. 1876 දී ප්‍රථම වරට ප්‍රකාශයට පත් කරන ලද මෙම වර්ගීකරණ සංග්‍රහය මේ වන විට විසිතුන් වතාවක් සංස්කරණය වී ඇත. වර්තමානයේ ලොව වඩාත්ම ප්‍රචලිත වර්ගීකරණ ක්‍රමය මෙය වන අතර එහි පවත්නා සරල බව ඊට මූලික වශයෙන් හේතු වී තිබේ. එහි උපලේඛන සාහිත්‍ය

DOI: https://doi.org/10.4038/sllr.v39i2.79

සඳහා සම්පූර්ණ වර්ග පංතියක් (800) වෙන් කර තිබීමත් සහායක වගුවලදී වැඩි අවධානයක් ඊට යොමුකර තිබීමත් දක්නට පුළුවන. ඩිවි දශම වර්ගීකරණයේ 23 සංස්කරණයේ සහායක වගු හයක් තිබේ. ඒවා අතරින් 3 සහායක වගුව වෙන් කර ඇත්තේ සාහිත්‍ය උප බෙදුම් සඳහාය. මෙම 3 සහායක වගුව 3A, 3B සහ 3C යනුවෙන් කොටස් තුනකින් ඉදිරිපත් කිරීම ද අවධානයට ලක්කළ යුතු කරුණකි. අන් කිසිදු සහායක වගුවක් එලෙස කොටස් කර නොමැත. ඩිවි වර්ගීකරණය විසින් මෙවන් අවධානයක් ප්‍රබන්ධ සාහිත්‍ය වර්ග කිරීම සඳහා යොමු කිරීමට මූලික වශයෙන් හේතු වී ඇත්තේ පසුගිය දශක කිහිපය තුළ ප්‍රබන්ධ සාහිත්‍ය අත්පත් කරගෙන තිබෙන ගුණාත්මක සහ සංඛ්‍යාත්මක වර්ධනයත් පාඨක රුචිකත්වයේ විවිධත්වය වර්ධනය වීමත්ය.

ඩිවි වර්ගීකරණයේ 800 හෙවත් සාහිත්‍ය වර්ග පංතියේ මූලික ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. එහි 800 – 809 දක්වා අංකවලින් ලෝකයේ සියලු සාහිත්‍යයන්ට පොදු අංග නියෝජනය වේ.810 සිට 899 දක්වා නියත භාෂා සාහිත්‍යයන්ට අයත් අංක දැක්වේ. එයින් 810 සිට 889 දක්වා ඇමරිකානු සහ බටහිර යුරෝපීය සාහිත්‍ය ද 890 සිට 899 දක්වා අන් සියලු රටවල සාහිත්‍ය ද නියෝජනය වේ. මේ අනුව ලොව ඕනෑම භාෂා සාහිත්‍යයකට ඩිවි වර්ගීකරණය අංකයක් වෙන් කර ඇත. එහෙත් සාහිත්‍යයට අයත් ප්‍රභේද හෝ ශානර ගණනාවක් තිබේ. උපලේඛනයේ අංකවලින් එම ශානර නියෝජනය නොවේ.මේ අනුව ඕනෑම භාෂාවකට අයත් සාහිත්‍යයක් තවදුරටත් බෙදා දැක්වීමට 3A, 3B සහ 3C සහායක වගුවලින් ඉඩ ප්‍රස්ථා සැලසේ. නියත භාෂා සාහිත්‍යයකට අදාළ ප්‍රධාන ශානර ලෙස පද්‍ය, නාට්‍ය, නවකතා සහ කෙටිකතා හැඳින්විය හැකිය. නියත භාෂා සාහිත්‍යයේ අංකයට 3A සහායක වගුවේ අංක එකතු කිරීමෙන් මෙම ශානරීය වෙනස නිරූපණය කළ හැකිය. නිදසුනක් ලෙස, සිංහල සාහිත්‍ය සඳහා උපලේඛනයේ අංකය 891.48 වේ. මෙම අංකයට 3A සහායක වගුවෙන් 3 ඉලක්කම එකතු කිරීමෙන් සිංහල නවකතා (891.483) වෙන්කර ගත හැකිය. එහෙත් වර්තමානයේ ප්‍රබන්ධ සාහිත්‍ය ඇසුරු කරන පාඨකයා සොයනුයේ හුදෙක් නවකතා පමණක් නොවේ. වත්මන් නවකතා පාඨක රුචිකත්වය ඉන් ඔබ්බෙහි පවත්නා උපශානරීය විවිධත්වය දක්වා ප්‍රසාරණය වී තිබේ. ඓතිහාසික ප්‍රබන්ධ, රහස් පරීක්ෂක ප්‍රබන්ධ, අද්භූත ප්‍රබන්ධ, විද්‍යා ප්‍රබන්ධ, ෆැන්ටසි ප්‍රබන්ධ එවන් උපශානර කිහිපයකි. ඩිවි වර්ගීකරණයේ 3B සහායක වගුවෙන් මෙම තත්ත්වය දක්වා වර්ගීකරණය ව්‍යාප්ත කිරීමට අවකාශ සලසා දී තිබේ. මේ අනුව, සිංහල ඓතිහාසික නවකතා සඳහා 891.483081 අංකය යෙදිය හැකිය. මේ ආකාරයට පද්‍යයේ උපශානර 3B සහායක වගුවේ දක්වා ඇත. ආඛ්‍යාන පද්‍ය, හයිකු, සොනාට්ට ඊට නිදසුන් කිහිපයකි. එමෙන්ම නාට්‍ය ද ඛේදාන්ත, ප්‍රහසන, ගුවන්විදුලි නාට්‍ය, රූපවාහිනී නාට්‍ය වශයෙන් 3B සහායක වගුවෙන් උපශානරවලට වෙන් කර ඇත. එමෙන්ම ප්‍රබන්ධ කෘතියක් රචනා කර ඇති සාහිත්‍යමය ශෛලියට අනුව වර්ගීකරණය ප්‍රසාරණය කිරීමට 3C සහායක වගුවෙන් ඉඩකඩ සලසා දී තිබේ. නිදසුනක් ලෙස, යථාර්ථවාදය, අධියථාර්ථවාදය, නූතනවාදය, පශ්චාත්නූතනවාදය යනාදිය දැක්විය හැකිය. ලෝකයේ සාහිත්‍ය මෙතරම් දුරකට වර්ධනය වී තිබියදී පාඨක ගවේෂණ චර්යා ප්‍රබල පරිවර්තනයකට ලක්ව තිබිය දී ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල තවදුරටත් අතිශය ප්‍රාථමික ක්‍රමයක්

Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 36-48
DOI: https://doi.org/10.4038/sllr.v39i2.79
අනුගමනය කිරීම එතරම් සුදුසු තත්ත්වයක් නොවේ. මන්ද, මෙවන් ප්‍රාථමික ක්‍රමයකින් ප්‍රබන්ධ සාහිත්‍යයේ විවිධත්වය කිසිසේත්ම පාඨකයාට සමීප කළ නොහැකි බැවිනි. විශේෂයෙන් වර්තමාන පාඨකයාගේ ප්‍රබන්ධ ගවේෂණ චර්යාව මෙම උපශාඛාරීය මට්ටම දක්වා වර්ධනය වී ඇති බව පැහැදිලිය. එම ගවේෂණ චර්යාවට සාර්ථකව ප්‍රතිචාර දැක්විය හැකි ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වර්ගීකරණ ක්‍රමයක් තිබිය දී ප්‍රාථමික සහ යල්පිනූ ක්‍රම යොදා ගැනීම මහජන පුස්තකාලවල ප්‍රතිරූපය වර්ධනයට සාධනීය දායකත්වයක් නොසපයනු ඇත.

පරිවර්තන සාහිත්‍ය වර්ගීකරණය

පැරණි වර්ගීකරණ ක්‍රමය තවදුරටත් භාවිත කිරීම වැඩි වශයෙන්ම නිශේධනාත්මක බලපෑමක් එල්ල කර ඇත්තේ පරිවර්තන ප්‍රබන්ධ සාහිත්‍ය වෙතය. ඉහතින් සඳහන් කළ පරිදි, පරිවර්තන ප්‍රබන්ධ සාහිත්‍යය පසුගිය වසර හැට තුළ දසගුණයකටත් වඩා වැඩි වර්ධනයක් අත්පත්කරගෙන තිබේ.එපමණක් නොව මුල් කෘතිවල භාෂාමය විවිධත්වය ද ඉහළ ගොස් ඇත. නමුත් මෙම වර්ධනයන් නොසලකා සියලු පරිවර්තිත ප්‍රබන්ධ ප්‍ර 3 ලෙස වර්ග කිරීමෙන් එකී වර්ධනය සහ විවිධත්වය පාඨකයාට කිසිසේත්ම සමීප නොවේ. ඩිවි දශම වර්ගීකරණයේදී ලෝකයේ සෑම භාෂා සාහිත්‍යයකටම අංකයක් ලබා දී තිබේ. මෙම වර්ගීකරණ ක්‍රමයට අනුව පරිවර්තිත ප්‍රබන්ධ සඳහා ලබා දිය යුත්තේ මුල් භාෂා සාහිත්‍ය අංකය මිස පරිවර්තිත භාෂා සාහිත්‍යයේ අංක නොවේ.

ඉංග්‍රීසි ප්‍රබන්ධ වර්ගීකරණය

විශේෂයෙන් ඉංග්‍රීසි ප්‍රබන්ධ වර්ග කිරීමේදී වර්ගීකාරකයෙකු විසින් අවධානයට ලක් කළ යුතු කරුණු කිහිපයක් තිබේ. ලෝකයේ ඉංග්‍රීසි සාහිත්‍ය බ්‍රිතාන්‍ය ඉංග්‍රීසි සහ ඇමරිකානු ඉංග්‍රීසි වශයෙන් කොටස් දෙකකට බෙදී තිබීම ඉන් එක් කරුණකි. පොදුවේ මෙහිදී ඉංග්‍රීසි භාෂාව භාවිත වුවද, ඇමරිකානු ඉංග්‍රීසිය බ්‍රිතාන්‍ය ඉංග්‍රීසියට වඩා අක්ෂර වින්‍යාසමය, උච්චාරණමය, යෙදුම්මය සහ සංස්කෘතිමය වෙනස්කම්වලින් යුක්තය. එහෙයින් ලෝක සාහිත්‍ය තුළ ඇමරිකානු සාහිත්‍ය යනුවෙන් වෙනම ප්‍රවර්ගයක් පවතී. මෙම තත්ත්වය සැලකිල්ලට ගන්නා ඩිවි දශම වර්ගීකරණය ඇමරිකානු සාහිත්‍ය සඳහා වෙනම වර්ග අංකයක් ලබා දී ඇත. (810) මෙල් විල් ඩිවි ඇමරිකානු ජාතිකයෙකු වීම ඊට අමතර උත්තේජනයක් සපයන්නට ඇත. කෙසේ වෙතත්, මෙම ප්‍රවර්ගය වෙන් වශයෙන් පාඨකයාට ඉදිරිපත් කිරීම අවශ්‍යය. විශේෂයෙන්, මෑතකාලයේ ඇමරිකානු ප්‍රබන්ධ සිංහලයට පරිවර්තනය වීමේ කැපී පෙනෙන වර්ධනයක් ද දක්නට ලැබේ. නිදසුනත් ලෙස, 2018 දී සිංහලයට පරිවර්තිත සමස්ත ප්‍රබන්ධ සංඛ්‍යාව 175 ක් වන අතර එයින් 48 ක්ම ඇමරිකානු ප්‍රබන්ධ වේ. එහෙයින් ඉංග්‍රීසි භාෂාවෙන් පරිවර්තිත කෘතියක් වර්ග කිරීමේදී එහි කතුවරයා ඇමරිකානු ජාතිකයෙකු දැයි නිශ්චය කිරීමට වර්ගීකාරයාට සිදු වේ. එසේ නොමැතිව, එයට ඉංග්‍රීසි සාහිත්‍යයේ අංකය (820) යෙදීම නිරවද්‍ය නොවේ. අනෙක් කරුණ වන්නේ ඉංග්‍රීසිය මව් භාෂාව ලෙස භාවිත නොකරන රටවල ඉංග්‍රීසි භාෂාමය සාහිත්‍යයක් ගොඩ නැංවී

DOI: https://doi.org/10.4038/sllr.v39i2.79

තිබීමය. මෙම තත්ත්වය කැපී පෙනෙන ලෙස දක්නට ඇත්තේ එක්තරා කාලයක බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය විසින් යටත් විජිත වශයෙන් පවත්වා ගෙන ගිය රටවලය. විශේෂයෙන් ආසියානු සහ අප්‍රිකානු රටවල මෙම තත්ත්වය දැකිය හැකිය. යටත් විජිත යුගයේදී මෙම රටවල ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය ඉහළ මට්ටමක පැවති බැවින් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රබන්ධකරණයේ යෙදෙන ලේඛක පරම්පරාවක් බිහි වී තිබේ. මෙම ඇතැම් යටත් විජිත පසුකාලීනව සිය ස්වදේශික භාෂා යටපත්කර ඉංග්‍රීසිය ප්‍රධාන භාෂාව බවට පත්කර ගෙන තිබේ. ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, කැනඩාව, දකුණු අප්‍රිකාව ඊට නිදසුන් කිහිපයකි. මේ අනුව ඕස්ට්‍රේලියානු ඉංග්‍රීසි ප්‍රබන්ධ, කැනේඩියානු ඉංග්‍රීසි ප්‍රබන්ධ, දකුණු අප්‍රිකානු ඉංග්‍රීසි ප්‍රබන්ධ වෙන් කර හඳුනා ගැනීම බෙහෙවින් වැදගත් වේ. නිදසුනක් ලෙස, ජේ. එම්. කොළුට්සි නම් ලෝක ප්‍රකට දකුණු අප්‍රිකානු ලේඛකයා ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රබන්ධකරණයේ යෙදෙන්නෙකි. ඔහු, පරිවර්තන ප්‍රබන්ධ වෙත ඇල්ම දක්වන සිංහල පාඨකයන් අතර ජනප්‍රිය නොබෙල් සාහිත්‍ය සම්මානලාභි ලේඛකයෙකි. ඔහුගේ කෘති ගණනාවක් සිංහලයට පරිවර්තනය වී ඇත. නිදසුන් ලෙස, මයිකල් කේ ගේ කල දවස, ම්ලේච්ඡයන් එනතුරු, යකඩ යුගය, ගර්භාව යනාදිය දැක්විය හැකිය. මේවා ඉංග්‍රීසි නවකතා (823) වේ. එමෙන්ම යට කී පරිදි මව් භාෂාව ඉංග්‍රීසි භාෂාව නොවන රටවල ද ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රබන්ධකරණයේ නියැලෙන ලේඛකයෝ සිටිති. මෙම රටවල් අතරින් ඉන්දියාව කැපී පෙනේ. ඉන්දියාවේ මෙම ලේඛක ලැයිස්තුව බෙහෙවින් දීර්ඝය. එය ආර්. කේ. නාරායන්, මුල්ක් රාජ් ආනන්ද්, අනීටා දේසායි, කුෂ්වන්ත් සිං යනාදීන්ගේ සිට අරුන්දතී රෝයි, කිරාන් දේසායි, අරවින්ද් අදීගා, අමිතව් ඝෝෂ්, චේතන් භගත් වැනි ලේඛක ලේඛිකාවන් දක්වා දිවේ. මොවුන්ගේ බහුතරයක් ප්‍රබන්ධ සිංහලයට පරිවර්තනය වී ඇත. මොවුන් විසින් රචිත නවකතාවලට යෙදිය යුතු වර්ග අංකය 823 මිස ඉන්දියානු භාෂා සාහිත්‍යයට අදාළ අංක නොවේ. ශ්‍රී ලංකාවේ ද මීට සමාන තත්ත්වයක් දක්නට ලැබේ. පුන්‍යකාන්ති විජේනායක, විජිතා ප්‍රනාන්දු, ඈන් රණසිංහ, ජීන් අර්සනායගම් එක්තරා කලෙක ශ්‍රී ලාංකීය ඉංග්‍රීසි සාහිත්‍ය බැබළ වූ ලේඛකයෝ වූහ. මෑත කාලීනව ෂෙහාන් කරුණාතිලක, නිහාල් ද සිල්වා, රොමේෂ් ගුණසේකර, ශ්‍යාම් සෙල්වදුරෙයි, විව්මරී වැන්ඩපුටන්, අශෝක් ෆෙරී, ප්‍රදීප් මැතිව් යනාදීහූ ඊට එක්ව සිටිති. මොවුන් විසින් රචිත නවකතා සඳහා ද නිවැරදි වර්ග අංකය වන්නේ 823 ය. පද්‍ය කෘති සඳහා 821 ය. මෙයින් පැහැදිලි වන්නේ මොවුන් කවර රටක ජීවත් වුව ද, කවර ජාතියකට අයත් වුව ද, කවර වාර්ගිකයන් වුව ද, ප්‍රබන්ධකරණයේ යෙදෙනුයේ ඉංග්‍රීසි භාෂාවෙන් බැවින් ඔවුන්ගේ කෘති ඉංග්‍රීසි සාහිත්‍ය යටතේ වර්ග කළ යුතු බවය. මහජන පුස්තකාලයකට අවශ්‍ය නම්, මෙම ඉංග්‍රීසි නවකතා රට අනුව වෙන් කර ගත හැකිය. ඒ සඳහා ඉංගීසි නවකතා අංකයට (823) රටේ භූගෝලීය අංකය 2 සහායක වගුවෙන් එකතු කිරීමට පුළුවන. එවිට ශ්‍රී ලාංකීය ඉංගීසි නවකතා සඳහා අංකය 823.5493 ලෙස යෙදේ. එලෙස වර්ග කිරීමෙන් රට අනුව ඉංගීසි නවකතා සොයා එන පාඨකයන්ගේ අවශ්‍යතා අවම කාලයක් තුළ ඉටු කළ හැකිය.

Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 36-48

DOI: https://doi.org/10.4038/sllr.v39i2.79

ස්පාඤ්ඤ ප්‍රබන්ධ වර්ගීකරණය

ස්පාඤ්ඤ සාහිත්‍ය දෙස බැලීමේදී ද මීට සමාන තත්ත්වයක් හඳුනාගත හැකිය. ස්පාඤ්ඤ භාෂාවෙන් ප්‍රබන්ධකරණයේ යෙදෙනුයේ ස්පාඤ්ඤ ජාතිකයන් පමණක් නොවේ. ස්පාඤ්ඤයද බ්‍රිතාන්‍ය මෙන්ම එක්තරා කාලවකවානුවක රටවල් රැසක් යටත් විජිත වශයෙන්ම පවත්වාගෙන ගිය අධිරාජ්‍යයකි. ඔවුන්ගේ අධිරාජ්‍ය ව්‍යාපෘතිය බොහෝදුරට ව්‍යාප්ත වූයේ දකුණු හෙවත් ලතින් ඇමරිකාව වෙතටය. මේ නිසා දකුණු ඇමරිකානු මහාද්වීපයේ රටවල් බොහොමයක පැවැති ස්වදේශික භාෂා යටපත් කරමින් ස්පාඤ්ඤ භාෂාව එම රටවල නිල සහ ව්‍යවහාර භාෂාව බවට පත් විය. එහෙයින් අද දක්වාම දකුණු ඇමරිකානු මහද්වීපයේ රටවල් බහුතරයක සාහිත්‍ය නිර්මාණය සඳහා ස්පාඤ්ඤ භාෂාව භාවිත කෙරේ. මෙම රටවල් වලින් ලෝකයේ සම්භාවනාවට පාත්‍ර වූ ප්‍රබන්ධකරුවන් ගණනාවක් බිහිවී ඇති අතර ඔවුන්ගේ කෘති රැසක් සිංහලයට පරිවර්තනය වී ඇත.ඉන්ද්‍රජාලික යථාර්ථවාදය, මායා යථාර්ථවාදය, ආශ්චර්යාත්මක යථාර්ථවාදය වැනි යෙදුම් සිංහල සාහිත්‍ය පාඨකයා වෙතට ගලා එන්නේ මෙම කලාපයේ ස්පාඤ්ඤ භාෂා සාහිත්‍යයෙනි. ගේබ්‍රියෙල් ගාර්ෂියා මාකේස්(කොලොම්බියාව), ඉසබෙල් අයියන්දේ (චිලී), මාරියෝ වර්ගාස් යෝසා (පීරු) සිංහල පාඨකයන් අතර අතිශයින් ජනප්‍රිය එවන් ලේඛකයන් තිදෙනෙකි. මොවුන් කවර රටක සිට ප්‍රබන්ධ රචනා කළ ද එය සිදුකරනුයේ ස්පාඤ්ඤ භාෂාවෙන් බැවින් ඔවුන්ගේ නවකතා සඳහා 863 අංකය යෙදිය යුතුය. අවශ්‍ය නම්, ඉංග්‍රීසි සාහිත්‍යයේ දී මෙන්ම ස්පාඤ්ඤ ප්‍රබන්ධ ද රට අනුව වෙන් කරගත හැකිය.

වර්ණ කේත භාවිතය

ප්‍රබන්ධ කෘති වර්ගීකරණයේදී මෙම පුස්තකාල වර්ග අංක හා වෙනත් සංකේතවලට අමතරව වර්ණ කේත ද භාවිත කර තිබීම නිරීක්ෂණයට ලක් විය. මෙම වර්ණ කේත භාවිතයේදී පොදු බවක්, ඒකමිතියක් සහ ප්‍රමිතියක් දක්නට නොවීය. ඒ ඒ පුස්තකාල තමන්ටම ආවේණික වර්ණ කේත භාවිත කර තිබිණි. ඇතැම් පුස්තකාලවල ඩිවි දශම වර්ගීකරණයේ සාරාංශ තුන නියෝජනය කිරීමට වර්ණ තුනක් යොදා තිබිණි.සමහර පුස්තකාලවල පොතෙහි ඇමතුම් අංකය එහි නාරටියේ අලවන ලද වර්ණ ලේබලය මත සටහන් කර ඇත. තවත් සමහර පුස්තකාලවල ඇමතුම් අංක ලේබලය සහ වර්ණ කේත ලේබලය වශයෙන් ලේබල් දෙකක් නාරටියේ අලවා තිබේ.එහෙයින් මෙම වර්ණ කේත භාවිතය අතිශය ව්‍යාකූලත්වයකින් යුත් ක්‍රමයක් බවට පත්ව ඇත. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ වර්ණ කේත භාවිත කිරීමේ අරමුණ පිළිබඳ පුස්තකාලයාධිපතීන්ට පැහැදිලි අදහසක් නොවීම බව පෙනේ. වර්ණ භාවිතය කිසිසේත්ම විද්‍යාත්මක වර්ගීකරණ ක්‍රමයකට ආදේශකයක් නොවේ.වර්ණ කේත භාවිතයේ එකම අරමුණ වන්නේ පොතක් වැරදි ස්ථානයක රාක්කගත වී ඇත්නම් පුස්තකාල කාර්යමණ්ඩලයට එය ක්ෂණිකව හඳුනා ගැනීමට අවකාශ සලසා දීමය. මන්ද, එය යම්කිසි කෘතියක ප්‍රධාන විෂය හෙවත් ප්‍රධාන වර්ග පංතිය හඳුනා ගැනීමට ඇති ආධාරකයක් පමණක් වන හෙයිනි. ප්‍රධාන වර්ග පංති සඳහා පමණක් වර්ණ කේත යොදා ගනුයේ එහෙයිනි. මේ නිසා වර්ණ කේත යෙදීම වර්ගීකරණ ක්‍රමයක් ලෙස

DOI: https://doi.org/10.4038/sllr.v39i2.79

භාවිත කිරීම අයෝග්‍ය මෙන්ම පුස්තකාල විද්‍යානුකූල නොවේ.එමෙන්ම පුස්තකාල එකතුව සඳහා වර්ණ කේත යෙදීම අනිවාර්ය නොවේ. වඩාත් වැදගත් වන්නේ නිරවද්‍ය වර්ග අංක භාවිතයයි. ළමා පුස්තකාල එකතු වර්ගීකරණයේදී නම් එය යම් ඵලදායිතාවකින් යුක්ත වනු ඇත. තවද, වර්ග පංති සඳහා වර්ණ කේතය තෝරා ගැනීමේ ද විවිධත්වයක් පවතී. ඇතැම් පළාත් සභා විසින් එම පළාතේ මහජන පුස්තකාල සඳහා වර්ණකේත මාලාවක් නිකුත් කර තිබේ. 2023 දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සියලු පුස්තකාලවලට ම භාවිත කළ හැකි වර්ණ කේත මාලාවක් හඳුන්වා දෙන ලදී. එමෙන්ම පොත්වල නාරටියේ අලවා ඇති වර්ණ ලේබල්වල නියම වර්ණය කාලයත් සමඟ වෙනසකට ලක් වී තිබීමද දැකගත හැකි විය. තවද, ඇතැම් වර්ණ ලේබල් මත ඇමතුම් අංකය කළු පැහැයෙන් සටහන් කිරීම නිසා එය පැහැදිලිව දර්ශනය නොවීම ද සිදුවේ. නිදසුනක් ලෙස දුඹුරු පැහැති ලේබලය මත කළු අකුරින් ඇමතුම් අංකය සටහන් කිරීම පෙන්වා දිය හැකිය. එහෙයින් වර්ණ කේත භාවිතයේ දී එහි තාර්කික එළඹුම පිළිබඳ සැලකිලිමත් වීම අවශ්‍ය වේ.

පුස්තකාලයාධිපතීන්ගේ අදහස්

මහජන පුස්තකාලවල ප්‍රබන්ධ සාහිත්‍යය වර්ගීකරණයට අදාළ මෙම තත්ත්වය පිළිබඳ ව ඒවායේ පුස්තකාලයාධිපතීන් සහ අනෙකුත් කාර්යමණ්ඩල සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය වූ කරුණු ගණනාවක් පවතී. පුස්තකාලයාධිපතීන් බහුතරයක අදහස පහත දැක්වේ.

"ඩිවි වර්ගීකරණය පාවිච්චි කරන එක පහසුවක් තමයි. ඒත් සෑහෙන කාලෙක ඉඳලා ප්‍රබන්ධ වර්ග කරලා තියෙන්නේ ප්‍ර1, ප්‍ර2, ප්‍ර3 විදිහට. මේ ක්‍රමය වෙනස් වෙන්න ඕනෙ. ඒත් ඒක කරන්න සෑහෙන කාලයක් ගතවෙනවා. ඒ වැඩේට යොදවන්න තරම් කාර්යමණ්ඩලයකුත් නෑ."

මෙයින් පෙනී යන්නේ ප්‍රබන්ධ වර්ගීකරණය සඳහා ඩිවි දශම වර්ගීකරණය භාවිතයේ අවශ්‍යතාව සහ යෝග්‍යතාව ඔවුන් පිළිගන්නා බවයි. එහෙත් මෙම වෙනස සිදු කිරීමට ගත විය හැකි කාලය සහ කාර්යමණ්ඩලයේ අඩුව ඔවුන් එකී කාර්ය වෙත යොමු කිරීමට බාධක ලෙස ක්‍රියාකරයි. තවත් සමහරු මෙවන් අදහස් දැක්වීය.

"පාඨකයෝ කාලයක් තිස්සේ මේ ක්‍රමයට හුරු වෙලා ඉන්නේ. ඒ හින්දා මේ ක්‍රමය වෙනස් කලොත් ඒක පාඨකයන්ට අවාසියක් වෙයි."

මෙම ප්‍රකාශයෙහි ඇත්තේ අර්ධ සත්‍යයක් පමණි. දැනට පවත්නා ක්‍රමය එලෙසම පවත්වාගෙන යාමේ නැඹුරුවත් අලුත් ක්‍රමයට විතැන්වීමට ඇති නොකැමැත්තත් එයින් පිළිබිඹු වේ. එහෙත් පාඨකයන් වඩාත් යාවත්කාලීන ක්‍රමවලට හුරුකරවීමත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් පුස්තකාල වෘත්තිකයන්ගේ ප්‍රමුඛ වගකීමකි.

Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 36-48
DOI: https://doi.org/10.4038/sllr.v39i2.79
පුස්තකාලයාධිපතීන් කිහිප දෙනෙකුගේ අදහස පහත පරිදි විය.

"දැන් අපි පරණ ක්‍රමයෙන් ඉවත්වෙලා ප්‍රබන්ධ පොත්වලට ඩිවි අංකය දානවා. අපි කොටසින් කොටස එහෙම කරගෙන යනවා."

මෙය බෙහෙවින් සාධනීය අදහසකි. කාලයක් තිස්සේ හුරුවී සිටි ක්‍රමයක් වෙනස් කිරීමේදී විවිධ බාධක මතුවීම ස්වාභාවිකය. එම බාධක ජයගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පුස්තකාල වෘත්තිකයන්ගේ නිර්මාණශීලීත්වය සහ පෞරුෂය මත රඳා පවතී.

නිර්දේශ

ඉහත සඳහන් අධ්‍යයනය පාදක කොටගෙන නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කළ හැකිය. එනම්,

ප්‍රබන්ධ සාහිත්‍ය වර්ගීකරණයේදී ප්‍ර1, ප්‍ර2, ප්‍ර3 නමැති පැරණි ක්‍රමය වෙනුවට ඩිවි දශම වර්ගීකරණය භාවිත කිරීම, අවශ්‍ය අවස්ථාවලදී ස්වතන්ත්‍ර ප්‍රබන්ධ සඳහා උපලේඛන අංකයෙන් නොනැවතී 3A සහ 3B සහායක වගුවල අංක භාවිතය දක්වා වර්ගීකරණය ප්‍රසාරණය කිරීම, මව් භාෂාව ඉංග්‍රීසි නොවන ලේඛකයන් විසින් ඉංග්‍රීසි භාෂාවෙන් රචිත කෘති වර්ගීකරණයේදී ඉංග්‍රීසි ප්‍රබන්ධ අංකය යෙදීම. අවශ්‍ය නම්, 2 සහායක වගුවෙන් භූගෝලීය අංකය භාවිත කර ඊට අනුව ඉංග්‍රීසි ප්‍රබන්ධ වෙන්කර ගැනීම, පරිවර්තන කෘතියේ මුල් භාෂාව කෘතියේ සඳහන්ව නොමැති නම්, අන්තර්ජාලය (උදා : විකිපීඩියා) ගවේෂණය කර එය නිශ්චිත කර ගැනීම, වර්ගීකරණ ක්‍රමයක් ලෙස නොව පොත රාක්කයේ වැරදි තැනක තැන්පත් වී ඇත්දැයි ක්ෂණිකව හඳුනා ගැනීමට පමණක් වර්ණ කේත භාවිත කිරීම, ඩිවි දශම වර්ගීකරණයේ ප්‍රධාන වර්ග පන්ති දහය සඳහා පමණක් වර්ණ කේත යොදා ගැනීම. දෙවන සහ තෙවන සාරාංශ සඳහා වර්ණ කේත භාවිත නොකිරීම, වර්ණ කේත භාවිතය අනිවාර්ය සාධකයක් නොවන අතර,එය භාවිත කරන්නේ නම් ඒ සඳහා ප්‍රමිතිගත වර්ණ කේත මාලාවක් යොදා ගැනීම. මේ සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සම්පාදනය කර ඇති වර්ණ කේත මාලාව භාවිත කිරීම, මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීමේදී ප්‍රබන්ධ කෘති එකතුව ඩිවි දශම වර්ගීකරණයට අනුව වර්ග කිරීම අනිවාර්ය සාධකයක් ලෙස සැලකීම, ප්‍රබන්ධ සාහිත්‍ය වර්ග කිරීම පිළිබඳ මහජන පුස්තකාල කාර්යමණ්ඩල සඳහා වැඩමුළු පැවැත්වීම, විශ්ව සාහිත්‍ය සහ කතුවරුන් පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පුස්තකාලයාධිපතීන් ස්වයං අධ්‍යයනයක යෙදීම යනාදි වශයෙනි.

ආශ්‍රිත මූලාශ්‍ර

ඩිවි දශම වර්ගීකරණය 16 සංස්කරණය. (1989). පරි. ජයසිරි ලංකාගේ. ගොඩගේ. කොළඹ

ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය 1962 – 1970. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය (පූර්ව කාලීන). (1941-1961). ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය 2018 කලාප. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය. කොළඹ

Brown, Catherine J. (2021). Enhanced access to fiction in public libraries: an overview Loughborough University.
https//doi.org. accessed on 20.05.2025

Cambridge dictionary (online). dictionary cambridge.org. accessed on 30.05.2025

Dewey Decimal Classification 23rd. ed. (2012). OCLC. Ohio

Eaglestone, Robert (2013). Contemporary fiction; a very short introduction Oxford University Press, Oxford

Pejtersen, Annelise Mark & Jutta, Austin (1983). Fiction retrieval: experimental design and evaluation of a search system based on user’s value criteria. Journal of Documentation 39 (4). 230-246 pp

The Public library service; IFLA / UNESCO guidelines for development (2001). K.G. Saur. Munchen

Ranganathan, S.R. (1931). Five Laws of Library Science, Ess Ess Publishing. New Delhi